**ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය - 2016**

-------------------------------------------------------

ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2006 දෙසැම්බර් 14 දින එළඹි අංක 2217 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ 6 උපලේඛනයේ 34 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම අනුව, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ජාතික මහාමාර්ග ජාලයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම හා මාර්ග අංශයේ ආයතන සවිබල ගැන්වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 21,655 කට සමාන එ.ජ.ඩො. මිලියන 208 ක් වූ අතර ඉන් රු. මිලියන 15,275 කට සමාන එ.ජ.ඩො මිලියන 150ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ඉහත ණය මුදලට අමතරව, අංක 1355 පී දරණ තවත් ණය ගිවිසුමක් ශ්‍රී ලංකා රජය විසින් ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල සමඟ 2010 ඔක්තෝබර් 04 දින අත්සන් කර තිබුණු අතර මෙම ව්‍යාපෘතිය මඟින් රු. මිලියන 880කට සමාන එ.ජ.ඩො මිලියන 8ක් වෙන් කිරීමට ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල විසින් එකඟවී තිබුණි. මුල් ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතිය එහි කටයුතු 2006 අප්‍රේල් 07 දින ආරම්භ කරන ලද අතර 2012 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලසුම්කර තිබුණි. ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදලේ මූල්‍යයන කටයුතු 2015 ජුනි 30 දින අවසන් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලය 2016 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මාවිසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලද වැඩිමනත් මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැසීමට පත්වන ලෙස සතුටුදායක ලෙස සසදා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අරමුදල් ගිණුමේ ආරම්භක ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා විශේෂ ඩොලර් ගිණුමට කරන ලද වියපැහැදම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ල ම බැ) ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසදා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුනේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා

සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2. <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

**2.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

මහාමාර්ග ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ අභ්‍යන්තර නිර්මාණ සැලසුම් සඳහා වූ රු. මිලියන 19.112 උපදේශන ගාස්තු ජාතික මහාමාර්ග ආශිත ව්‍යාපෘති අතිරේක මුල්‍යායනය නමින් හඳුන්වන ව්‍යාපෘතියට වැරදි ලෙස ගිණුම්ගත කර තිබුණි.

**3. <u>මූල්‍ය හා භෞතික කාර්ය සාධනය</u>**

**3.1. <u>අරමුදල් උපයෝජනය</u>**

මුල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂයේ අරමුදල් උපයෝජනය හා 2016 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් පිළිබඳ වැදගත් සංඛ්‍යානමය දත්ත සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යායනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් 2016 වර්ෂය තුල | | උපයෝජනය කළ අරමුදල් 2016 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ. ඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ. ඩො මිලියන | රු. මිලියන | එ.ජ. ඩො මිලියන | රු. මිලියන |
| ආසංබැ | 150.00 | 15,275 | - | - | - | 150.00 | 17,272 |
| ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල | 8.00 | 880 | - | - | - | 8.00 | 928 |
| ශ්‍රී ලංකා රජය | 58.00 | 6,380 | 284,45 | 0.59 | 86.75 | 62.07 | 9,177 |
| | 216.00 | 22.535 | 284.45 | 0.59 | 86.75 | 220.07 | 27,377 |

**3.2 <u>භෞතික ප්‍රගතිය</u>**

ලැබුණු තොරතුරු අනුව ජාතික මාර්ග 06ක කිලෝ මීටර් 353 ක කොටසක ඉදිකිරීම් වැඩ නිම කොට 2014 දෙසැම්බර් 31 ට මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි. තවද මහාමාර්ග ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් වැඩ 2016 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත් ගොඩනැගිල්ලේ අභ්‍යන්තර නිර්මාණ සැලසුම් වැඩ සමාලෝචිත වර්ෂය අවසානයට නිමකර නොතිබුණි.

**3.3** <u>කොන්ත්‍රාත්තු පරිපාලනය</u>.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහා මාර්ග ලේකම් කාර්යාල මහල් 3කින් සමන්විත ගොඩනැගිලි ඉදිකිරීම් කොන්ත්‍රාත් වැඩ 2010 දී ප්‍රදානය කළ අතර පසුව එය මහල් 10 කින් සමන්විත වන පරිදි කොන්තාතුවේ විෂය පථය වෙනස් කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2010 දී ඇස්තමේන්තු කළ ඉදිකිරීම් පිරිවැය වූ රු.මිලියන 599.30. 2016 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 2,057.25 දක්වා වැඩි වී තිබුණි. ශ්‍රී ලංකා රජයේ වෙන් කළ ප්‍රතිපාදන මත වෙනස් වූ වැඩ සඳහා පිරිවැය දැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2015 දෙසැම්බර් 10 දින ලබා ගෙන තිබුණි. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ දෝෂ වගකීම් සහිත කාලය 2016 සැප්තැම්බර් 10 දින අවසන් වී තිබුණද ගොඩනැගිල්ලේ දෝෂ නිවැරදි කිරීම සඳහා රු.මිලියන 9.55 ක පිරිවැයට වෙනම කොන්ත්‍රාත්තුවක් පෞද්ගලික සමාගමකට 2015 ජූලි 07 දින ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත් උපදේශකවරුන් වැඩ සම්පූර්ණ කිරීමේ වාර්තාව 2017 මැයි 30 දින වන විටත් නිකුත් කර නොතිබුණු අතර ව්‍යාපෘතිය රඳවා ගත් මුදල් 2016 දෙසැම්බර් 31 දින නිදහස් කර තිබුණි.

(ආ) විදුලි ජනක යන්ත්‍ර, භූගත ඉන්ධන ටැංකිය, දත්ත ජාල සේවා පද්ධතිය, විදුලි ආරෝපන හා වායුසමීකරණ පද්ධතිය ආදි උපාංග කීහිපයක් රු.මිලියන 495.39 ක පිරිවැයට ප්‍රසම්පාදනය කර ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා ප්‍රධන කොන්ත්‍රාත්තුවේ විචලනයක් ලෙස සලකා තිබුණද මුල් ප්‍රමාණ පත්‍රයහි එම විෂයයන් ඇතුලත් කර නොතිබුණි. එම නිසා පොදු කාර්ය වියදම්, සවිකිරීමේ ගාස්තු, ලාභ ආන්තික ආදිය මත සියයට 35 ක් දක්වා අමතර ගාස්තු ඉල්ලීමට කොන්ත්‍රාත්කරුට ඉඩ සලසා තිබුණි. තවද ගොඩනැගිල්ලේ වායු සමීකරණ පද්ධතිය රු.මිලියන 218.93 කට ප්‍රසම්පාදන කර සවිකර තිබුණද 2017 මැයි 30 දක්වා එය නියමාකරණයෙන් ක්‍රියාත්මක වී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අතිරේක වායු සමීකරණ 30 සවි කිරීම සඳහා රු.මිලියන 5.25 ක් අතිරේකව වැය කිරීමට සිදුවී තිබුණි.

(ඇ) කාමර බෙදා වෙන්කිරීම, සිවිලිමේ වැඩ, ගෘහ භාණ්ඩ සැපයීම හා සවි කිරීම හා දැවමය වැඩවල අභ්‍යන්තර නිමාවන් හා ගෙබිමේ වැඩ (flooring work) කොන්ත්‍රාත්කරුවන් 04 දෙනෙකුට රු.මිලියන 241.60 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු සමග එකග වූ පිරිවැය පසුව රු.මිලියන 85.50 කින් වැඩිකර තිබූ අතර දින 147 සිට 154 දක්වා පරාසයකින් කාලය දීර්ඝ කර තිබුණි.

(ඇ) යාන්ත්‍රික හා විදුලි වැඩ සැපයීම හා සවිකිරීම සඳහා ප්‍රදානය කළ කොන්ත්‍රාත්තු රු.මිලියන 3.86 ක සියයට 55 ක් නිම කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරුවන්ගේ අසාර්ථකත්වය නිසා අවලංගු කර තිබුණි.

**3.4** <u>**නිෂ්කාර්ය වත්කම්.**</u>

ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරය සඳහා රු.මිලියන 6.47 පිරිවැයකට ප්‍රසම්පාදනය කළ පොදු ඇමතුම් පද්ධතිය අවුරුදු 02 කට වඩා කාලයක් නිෂ්කාර්ය තිබූ බව නිරීක්ෂණය විය.